සිප්සවි

කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රාථමික අංශය

අනාවරණ පරීක්ෂණය - 2024

5 ශ්‍රේණිය

I පත්‍රය

කැගල්ල අධ්‍යාපන කලාපය
கேகல்லே கல்வி மண்டலம்
Kegalle Education Zone

කාලය : පැය 1 යි

★ **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

★ **කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් භාවිතා කරන්න.**

අංකය : .....


පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය.	V/II/S/CH

අනෙක් පිටුව බලන්න.

- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.


01. සමාන කමක් නොදක්වන රූප යුගලය තෝරන්න.




A B C D

(i) AD (ii) BC (iii) BD


02. හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.




03. රටාව අනුව ...?... ට ගැළපෙන රූපය තෝරන්න.



04. පහත රූපවල මුල් රූප දෙක අතර කිසියම් සම්බන්ධතාවක් ඇත. එම සම්බන්ධතාවය හොඳින් අවබෝධ කරගෙන 3 වන රූපය සමඟ එම සම්බන්ධතාවය ඇති කරන රූපය පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.




05. මුල් රූප දෙක අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත. එම සම්බන්ධතාවය ඇති රූපයක් ඉතිරි රූප අතරින් සොයා යටින් ඉරක් අඳින්න.




අනෙක් පිටුව බලන්න.

06. රූපයේ ? ලකුණින් දැක්වෙන ස්ථානයට තිබිය යුතු අගය තෝරන්න.



(i) 13 (ii) 15 (iii) 18

07. පහත රූපයේ + හා × හැඩයට රේඛා ගමන්කර ඇති මුළු වාර ගණන කීය ද?



(i) 16
(ii) 14
(iii) 12

08. කාඩ් පත් ආශ්‍රිත ව දී ඇති කවර ප්‍රකාශය නිවැරදි වේ ද?

P ලේකම්	Q චුම්භක	R සාකච්ඡාව	S විශිෂ්ඨ	T පුස්ථකාලය

(i) R,S නිවැරදි වන අතර T වැරදි වේ.

(ii) S,T නිවැරදි වන අතර P වැරදි වේ.

(iii) P,R නිවැරදි වන අතර Q වැරදි වේ.

09. අන්නාසි ගෙඩියක මිල රු.80 කි. අඹ ගෙඩියක මිල රු.60 කි.අඹ ගෙඩියකින් බීම වීදුරු 8 ක් සාදා ගත හැකි ය. අන්නාසි ගෙඩියකින් බීම වීදුරු 12 ක් සෑදිය හැකිය. 48 කට සංග්‍රහ කිරීමට වඩා ලාබදායක වන්නේ,

(i) අන්නාසි මිල දී ගැනීමයි.

(ii) අඹ මිල දී ගැනීමයි.

(iii) දෙකෙන් ම සමාන ගෙඩි ගණනක් මිල දි ගැනීමයි.

10.
$$\begin{array}{r} A\ B\ C \\ -\ B\ B\ A \\ \hline D\ A\ A \end{array}$$

A,B,C,D යනු ඉලක්කම් වේ. මෙහි A = 9 ද, B = 7 ද නම්, C හා D හි අගය වන්නේ,

(i) 8 , 1 (ii) 6 , 2 (iii) 6 , 4

11. අනාගතේ බිය අඳුර නසන්නේ
<u>දාඩිය හින්දයි</u> ලොව පවතින්නේ

යටින් ඉරි ඇඳ ඇති පදවල සැබෑ අර්ථය අනුව ලොව පවතින බව කියවෙන්නේ,

(i) උත්සාහය මතය (ii) දාඩිය මතය (iii) වැඩ කිරීම මතය

12. මුලින් දී ඇති ප්‍රකාශය අනුව බැසගත හැකි නිවැරදි නිගමනය තෝරන්න.


"5 අරලිය" පන්තියේ සියලු ම ළමුන් අති දක්ෂ ය. දිනුලි එම පන්තියේ අන්තිමයා විය.

(i) දිනුලි දුර්වල ශිෂ්‍යාවකි.

(ii) දිනුලි ද දක්ෂ ශිෂ්‍යාවකි.

(iii) දිනුලි අනෙක් සිසුන් අභිබවා සිටියි.

13. පහත දී ඇති රූප සටහන ඇසුරින් පිළිතුරු තෝරන්න.




පහත සඳහන් කුමන ප්‍රකාශය සත්‍යය ද?

(i) ◯ හී ඇත්තේ 3 න් බෙදෙන සංඛ්‍යා පමණි.

(ii) △ හී ඇත්තේ 3 න් බෙදෙන සංඛ්‍යා පමණි.

(iii) ▭ හී ඇත්තේ 5 න් බෙදෙන සංඛ්‍යා පමණි.

14. රූපයේ තවත් කොටු 3 ක් අඳුරු කළ විට, අඳුරු නොකළ ප්‍රමාණය මුළු රූපයෙන්,



(i) $\frac{1}{2}$ කට සමාන ය (ii) $\frac{1}{2}$ කට වැඩි ය

(iii) $\frac{1}{2}$ කට අඩු ය


- පහත ඡේදයේ දැක්වෙන විස්තරය කියවා 15 ප්‍රශ්නය ට පිළිතුරු සපයන්න.

කාලයෙන් කාලයට මාගේ හැඩරුව වෙනස් විය. බිත්තරය තුළ මා සිටි කාලය කොපමණ දැයි මතක නැත. එහෙත් පීනා ගිය කාලයත් මට හොඳින් මතකය. මිනිසුන් මාගේ වාසභූමි ගොඩකර ගෙවල් සෑදීම නිසා මට ඇත්තේ විශාල අනතුරකි.

15. මෙහි කියවෙන සතා වන්නේ,

(i) ගෙම්බා (ii) සමනලයා (iii) කුරුල්ලා


16. පහත දැක්වන රෝදය කරකැවීමේ දී A ස්ථානය 10 වාරයක් බිම ස්පර්ශ වන විට මීටර 5 ක දුරක් ගමන් කරයි නම්, මෙම රෝදයේ වටේ දිග කොපමණ ද?



(i) 100cm (ii) 50cm (iii) 10cm

අනෙක් පිටුව බලන්න.


17. මුලින් දී ඇති රූපය නිර්මාණය කර ගැනීමට යොදා ගෙන ඇති හැඩතල ඇතුළත් පිළිතුර වන්නේ,



18. සාමා හා නදී යන දෙදෙනාගේ බරෙහි එකතුව 64kg කි. නදී හා දිනූ යන දෙදෙනාගේ බරෙහි එකතුව 64kg කි. සාමා , නදී හා දිනූ යන තිදෙනාගේ බර 98kg වේ. දිනූගේ බර කොපමණ ද?

(i) 34kg (ii) 32kg (iii) 38kg

- පහත දී ඇති සංඛ්‍යා රටාව තේරුම් ගෙන 19 , 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




19. 'A' ස්ථානයට තිබිය යුතු අගය වන්නේ,

(i) 42 (ii) 56 (iii) 63

20. 'B' ස්ථානයට තිබිය යුතු අගය වන්නේ,

(i) 198 (ii) 99 (iii) 162

21. මුලින් දී ඇති රූපයේ කොටස් කිහිපයක් යොදාගෙන දෙවන රූපය නිර්මාණය කර ඇත. එහි අක්ෂර නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,




අනෙක් පිටුව බලන්න.

22. P හා Q යන සංඛ්‍යාවල එකතුව 19 කි. P x Q වල අගය 84 ක් වේ.P වල අගය Q වල අගයට වඩා විශාල නම්, P වල අගය කීය ද?

(i) 7 (ii) 12 (iii) 15


- අංක 23 හා 24 ප්‍රශ්නවල සංඛ්‍යා රටා අනුව හිස්තැනට ගැළපෙන පිළිතුර වන්නේ,

23.



(i) 2 (ii) 4 (iii) 6

24.



(i) 7 (ii) 8 (iii) 6

25. තැටි තරාදියක් , කිලෝග්‍රෑම් එකකට වඩා සීනි ප්‍රමාණයක් සහ කිලෝග්‍රෑම් එකේ පඩියක් ළමයෙකුට ලබාදුන් පසු වෙනත් කිසිම දෙයක උපකාරයක් නොවන්නට ඔහුට සීනි ග්‍රෑම් 250 ක ප්‍රමාණයක් කිරා ගත හැකි ද?

(i) හැකි ය (ii) නොහැකි ය (iii) කිව නොහැක

26. ' ? ' ලකුණින් දැක්වෙන ස්ථානය ට තිබිය යුතු අගයයන් වන්නේ,


10	3	8
5	7	?
6	?	4

(i) 9 , 11 (ii) 8 , 4 (iii) 5 , 9


27. වචන නිවැරදි ලෙස සම්බන්ධ කළ විට දැකගත හැකි ඉරි රටාව තෝරන්න.

පොත	ඇඟිල්ල
හිරමණය	ගඟ
කිණිහිර	පුස්තකාලය
ඔරුව	කම්මල
දිදාලය	මුළුතැන්ගෙය


(i)



(ii)



(iii)




අනෙක් පිටුව බලන්න.

28. සාමා උපන්නේ 2009 වර්ෂයේදී ය. ඇය උපන් වර්ෂය අයත් වන්නේ 21 වන සියවසේ පළමු වන දශකයට ය. ඇයගේ පියා 20 වන සියවසේ හත්වන දශකයට අයත් වේ නම්, පියා උපන් වර්ෂය විය හැක්කේ,

(i) 1990 (ii) 1971 (iii) 1968

29. පහත දී ඇති රූපයට අනුව, A නගරයේ සිට B නගරයට ඇති කෙටි ම දුර කොපමණ ද?




(i) 20km (ii) 16km (iii) 12km

30. 600 ℓ ක ටැංකියක් පිරවීමට A නළයට පැය 3 ක් ගතවේ. එම ටැංකියේ අඩක් පිරවීමට B නළයට පැය 2ක් ගතවේ. A හා B යන නළ දෙක ම එකවර ඇර පැය1 මිනි. 30 කට පසු ටැංකියේ පිරී ඇති ජල ප්‍රමාණය වන්නේ,

(i) 525 ℓ (ii) 450 ℓ (iii) 350 ℓ

31. පහත සඳහන් රූප හොඳින් පරීක්ෂා කර බලා නොගැළපෙන රූපය තෝරා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.


1 2 3 4



(i) 2 (ii) 3 (iii) 4

32. පහත රූපයේ දැක්වෙන මල කැපුම් වාර දෙකකින් කැපීමට සමචතුරස්‍රාකාර කඩදාසියක් නැමිය යුතු වාර ගණන නිවැරදි ව දැක්වෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

(i) 2
(ii) 3
(iii) 4



33. ගොවිපළක සිටින සතුන්ගේ මුළු පාදවල එකතුව 44 කි. එහි සිටින සතුන් නිවැරදි ව දක්වා ඇති පිළිතුර වන්නේ,


(i) කුකුළන් 8 , එළුවන් 4 , ගවයින් 3

(ii) කුකුළන් 4 , එළුවන් 5 , ගවයින් 3

(iii) කුකුළන් 3 , එළුවන් 4 , ගවයින් 4

අනෙක් පිටුව බලන්න.

- පහත විස්තරයට අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.




34. දොඩම් ගෙඩියක මිල රු. 40 ක් නම් මැංගුස් ගෙඩි 4ක මිල කීය ද?

(i) රු.80.00 (ii) රු.60.00 (iii) රු.40.00

35.  මිල කීය ද?

(i) රු.240.00 (ii) රු.280.00 (iii) රු.300.00

36. නිවැරදි ව දර්ශනය වන රූපය තෝරන්න.

(i) 

(ii) 

(iii) 

37. තත්පර 5 ක් දිය කළ විට වැඩි ම පැණි රසක් ඇති බඳුන තෝරන්න.

(i) සීනි



සාමාන්‍ය ජලය

(ii) සීනි



උණු ජලය

(iii) සීනි



අයිස් වතුර

38. නිසි අධ්‍යාපනයක් නොලැබීමෙන් සිදුවන බරපතළ ම හානිය වන්නේ,

(i) රැකියාවක් නොලැබීම (ii) දුප්පත් වීම (iii) දැනුම නොලැබීම

39. නිවසක භාවිතයට ගන්නා සාමාන්‍ය ඇඳක දිග ආසන්න ලෙස කොපමණ ද?

(i) 200cm (ii) 4m (iii) 110cm

40. කොටුවේ ඇති විස්තරය අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

A	+	B	=	35
D	+	A	=	27
C	+	B	=	38

(i) B වලට වඩා D වල අගය වැඩිය

(ii) A වලට වඩා C වල අගය වැඩිය

(iii) D වලට වඩා B වල අගය අඩුය

සිප්සවි

කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රාථමික අංශය

අනාවරණ පරීක්ෂණය - 2024

5 ශ්‍රේණිය

II පත්‍රය

කැගල්ල අධ්‍යාපන කලාපය
கெகல்லே கல்வி மண்டலம்
Kegalle Education Zone

කාලය : පැය 1 මි. 15 යි

★ **පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්න වලට පිළිතුර තිත් ඉර මත ලියන්න.**

★ **කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් භාවිතා කරන්න.**

අංකය : .....

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය.	V/II/S/CH

1) පේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අපේ නිවසේ කුස්සිය අසල ලොවි ගසකි. දිනක් පැණි කුරුල්ලෙක් ලොවි ගස වටේ පියඹා ගියේ ය. ඊට පසු ද ඌ එසේම කළේ ය. ටික දිනකට පසු ඌ කුඩා කොටු, කෙඳි වර්ග ලොවි ගසට රැගෙන ආවේ ය. ලොවි ගසේ අත්තක **<u>ඌ කූඩුවක් සෑදීම ආරම්භ කළේ ය.</u>**

i) පේදයේ සඳහන් වන්නේ කවුරුන් ගැන ද?

.....

ii) ඌ කූඩුව සෑදීම ආරම්භ කළේ කොහේ ද?

.....

iii) ඌ ලොවි ගසට රැගෙන ආ දේවල් මොනවාද?

.....

iv) ප්‍රාණවාචී ඒක වචන පදයක් පේදයෙන් තෝරා ලියන්න.

.....

v) මෙහි සඳහන් මහප්‍රාණ අක්ෂරයක් ලියා දක්වන්න.

.....

vi) පේදයේ සඳහන් ඉරි ඇඳි වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

.....

2) පහත වචනයේ ඉරි ඇඳි අකුරට යෙදි ඇති ශබ්දය හා පිල්ලම ලියන්න.

වචනය	ශබ්දය	පිල්ලම් නාමය
වෘශ්චික	.....	.....

3) පහත දැන්නේනේ පෞද්ගලික ලිපියක ආකෘතියකි. එහි අංක 1, 2, ස්ථානවලට ආ යුත්තේ කුමක්දැයි අංකය ඉදිරියෙන් ඇති හිස්තැන මත ලියන්න.

1) .....

2) .....

4) පහත වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

i) වඩා / ඔරුව / හොඳ / නැවැත්වූයේ / තැනක ය

.....

ii) ඉහළින් / වලාකුළු / වැහි / කඳු / වන්නට / මුදුන්වලට / විය / ඒකරාශි

.....

5) පහත වාක්‍ය ස්ත්‍රී ලිංගයට හරවා නැවත ලියන්න.

(i) වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කරයි.

.....

(ii) ඔහු පුස්තකාලයෙන් පොතක් ගත්තේ ය.

.....

6) මුවා ශාක පමණක් ආහාරයට ගන්නා (ශාක භක්ෂක) සතෙකි.

මෙහි සඳහන් විරාම ලක්ෂණ හඳුන්වන්න.

.....

7) හිස්තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(i) ..... ඇඳුම් මැසුවා ය.
(ii) ..... සුළඟට කඩා වැටුණේ ය.
(iii) ..... උදෑසනම පාසල් ගියෝ ය.

(ගස් /අයියලා / මල්ලී / නංගී / ඔවුන් / තරුය)

8) පහත පදවල අදහස ලියන්න.

(i) ස්වේච්ඡාවෙන් - ..... (ii) නොහික්මුණු - .....


9) පහත තේරවිලි සඳහා ගැළපෙන පිළිතුරු ලියන්න


i) සිතුවම් අඳින සල - ..... ii) ගසේ තිබෙන ලිය - .....

10) පහත අදහස ගැලපෙන ඉඟි වැකිය ලියන්න.

i) ඉටු නොවන සිහින මැවීම - .....
ii) ඉතා ම කුඩා ප්‍රමාණයක් - .....

11) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

1) 

2) 

....

12) පහත දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i) a / see / can / house / I - .....

ii) play / the / are / a / we / ground / playing / in

.....

13) පහත ඉංග්‍රීසි වචනවලට ගැළපෙන සිංහල අර්ථය ලියන්න.

i) Squirrel - ..... ii) Nurse - .....

14) පහත දෙමළ වචනවලට ගැළපෙන සිංහල අර්ථය ලියන්න.

i) පුහෙයිරද නිලෙයම් - ..... ii) මුන්නාල් - .....

15) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.

i) හතළිස් අටදහස් පන්සිය එක. ඉලක්කමෙන් ලියන්න. - .....

ii) පහත සංඛ්‍යාවට 101 ක් එකතු කළ පසු ලැබෙන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

14 899 - .....

16) යහළුවන් තුන් දෙනෙකු එකතු කළ මුද්දර සංඛ්‍යාව පිළිවෙළින් 4270, 62, 702 ක් වේ. ඔවුන් තිදෙනා ම එකතු කළ මුළු මුද්දර සංඛ්‍යාව කීය ද?

.....

17) දොඩම් ගෙඩි දෙකකින් පස් දෙනෙකුට බීම සෑදිය හැකි ය. දොඩම් ගෙඩි හතළිහකින් කී දෙනෙකුට බීම සෑදිය හැකි ද?

.....

18) එක භාජනයකට ජලය 12l 75ml ක් අල්ලයි. තවත් භාජනයකට ජලය 21l 50ml ක් අල්ලයි. භාජන දෙකට ම අල්ලන මුළු ජල ප්‍රමාණය කොපමණ ද?

.....

19) සරඹ සන්දර්ශනයකට සහභාගී වූ එක් සිසුවෙකුට හතර බැගින් බැලුන් 832 ක් බෙදා දෙන ලදි. සරඹ සන්දර්ශනය සඳහා සහභාගී වූ මුළු සිසුන් ගණන කීය ද?

.....


20) රුපියල් 100 ක් මුදලක් නෝට්ටු තුනකින් හා කාසි දෙකකින් ගෙවිය හැකි ආකාරය ලියන්න.

.....

21) පහත වේලාවන් කියවිය හැකි තවත් ආකාරයක් අකුරින් ලියන්න.

පහ පසු වී මිනිත්තු පනහ	.....
.....	දහයට මිනිත්තු විස්සයි


22) පැන්සල් දෙකේම දිග කීය ද? .....



23) පහත සංඛ්‍යාවට පෙර හා පසු සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ලියන්න.

....., 7 , ...

24) දී ඇති භාගය පහත රූපයේ පාට කරන්න.




i) $\frac{3}{4}$


ii) බොත්තම් 56න් දෙකෙන් පංගුවක ඇති බොත්තම් ගණන කීය ද? .....

25) පහතින් ඇති තරාදියේ බර සමාන වී ඇත. ඒ අනුව මාළුවාගේ බර කෙපමණද?

.....Kg .....g




26) පහත දැක්වෙන හැඩතල යොදාගෙන සෑදිය හැකි ඝන වස්තු දෙකෙහි නාමයන් ලියන්න.



..... , ...

27) කිසියම් ප්‍රදේශයක නගර කිහිපයක් පිහිටා ඇති ආකාරය පහත සැලැස්මේ දැක්වේ.




F නගර පිහිටා ඇත්තේ B නගරයට කුමන දිශාවෙන් ද? .....

28) වෙරළු ගෙඩි දහසකින් වෙරළු ගෙඩි තුන්සිය අසූ හතක් විකුණු පසු ඉතිරි වෙරළු ගෙඩි ගණන කීය ද?

.....

29) පාසලක ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් දිනක් තුළ පාසල් නොපැමිණීම පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.



i) හොඳම පැමිණීමක් ඇත්තේ කුමන ශ්‍රේණියේ ද?

.....

ii) දෙක ශ්‍රේණිය මෙන් දෙගුණයක් ළමයි නොපැමිණියේ කුමන ශ්‍රේණියේ ද?

.....

ප්‍රශ්න අංක 30 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරින් තෝරා යටින් ඉරක් අඳින්න.

30) සූර්ය නමස්කාරයේ දෙවන අවස්ථාව කුමක් ද?

i) ශරීරය පොළවට සමාන්තර වන සේ බිම නිදා ගැනීම.
ii) දෑත් ඉහළට ඔසවා පසුපසට නැවීම.
iii) ශරීරය ඉදිරියට නවා දෑතින් දෙපා ඇල්ලීම.

31) ආදර්ශ පාඨයක් නොවන්නේ,

i) සතුන්ට හිංසා නොකරමු.
ii) පරිසරය විනාශ නොකරමු
iii) ජාතික ගීයට ගරු නොකරමු

32) ජාතික කොඩියේ සතර බ්‍රහ්ම විහරණ දක්වා ඇත්තේ,

i) බෝ කොළ සතරින් ය
ii) කොඩියේ ඇති වර්ණ සතරකින් ය
iii) කඩුව අතින් ගත් සිංහයාගෙන් ය

33) ''ගජමන් නෝනා" කිවිඳිය කවි ලියා ඇත්තේ පහත සඳහන් කුමන ශාකය පිළිබඳව ද?

i) ශ්‍රී මහා බෝධිය
ii) දෙනිපිටියේ නුග රුක
iii) ඕපනායක යෝධ පුස්වැල

34) මල් හා ගෙඩි යන දෙවර්ගය ම ඖෂධීය පානයක් ලෙස යොදා ගත හැකි ශාකය වන්නේ,

i) රණවරා ii) බෙලි iii) පොල්පලා

35) අලුදෙණියේ බණ්ඩා, දාවිත් හෙවත් ඩේවිඩ්, දොන් පුල්ලේ වෙදරාළ ආදී නම් වලින් හැඳින්වූයේ,

i) වීර පුරන් අප්පු
ii) මොනරවිල කැප්පෙටිපොළ දිසාව
iii) ගොංගාලේ ගොඩබණ්ඩා

36) ලොකු ගලක් පෙරළාගෙන යාමට අවශ්‍ය වැඩ පහසු කිරීමේ උපකරණයකි.

i) විල්බැරෝව ii) අලවංගුව iii) උදැල්ල

37) මැටි යොදාගෙන කූඩු සාදන පක්ෂියෙකි.

i) දෙමලිච්චා ii) වඩු කුරුල්ලා iii) වැහිලිහිණියා

38) සුළං ටකය යොදා ගන්නේ,

i) සුළං හමන දිශාව හඳුනා ගැනීමට
ii) සුළඟේ වේගය මැනීමට
iii) වගාවන් සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට

39) කාල නියමයක් ඇතිව පිපෙන මල් වර්ග දෙකකි.


i) එරබදු මල් , රබර් මල්
ii) කුමුදු මල් , පොල් මල්
iii) නෙලුම් මල් , රෑ කුමරි මල්

40) නෙල්ලි, දොඩම්, දෙහි වැනි පලතුරුවල අඩංගු වන්නේ,

i) විටමින් A ii) විටමින් C iii) විටමින් E

41) පහත සතුන් අතරින් කිසියම් ලක්ෂණයක් අනුව වෙනස් සතා තෝරන්න.

i) 

2) 

3) 

42) ''පන්නා ඒ ලන්දේසි'' යන කවිය.

i) පැරණි හටන් කාව්‍යකි
ii) ජන කවියකි
iii) යහ පුරුදු පිළිබඳ ව කියවෙන කවියකි

43) ඉදිකටු රඳවනයක් මසා ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සඳහන් පිළිතුර තෝරන්න

i) රවුම් හැඩයට කපාගත් රෙදි කැබලි දෙකක් හා ඊට වඩා කුඩා රෙදි රවුමක්
ii) රවුම් හැඩයට කපා ගත් රෙදි කැබලි එකක් හා ඊට වඩා කුඩා රෙදි රවුම් එකක්.
iii) රවුම් හැඩයට කපා ගත් කුඩා රෙදි කැබලි දෙකක් හා ඊට වඩා ලොකු රවුම් රෙදි කැබලි එකක්

44) වැඩ පහසු කිරීමට භාවිතා කරන යන්ත්‍ර සූත්‍රවලින් ඇති ප්‍රයෝජනයක් නොවන්නේ,

i) යම් කාර්යයක් ඉක්මනින් කර ගැනීමට හැකි වීම
ii) කාලය ඉතිරි වීම
iii) යන්ත්‍රයකට ඇඟිලි අත පය හසු වීම

45) පෞද්ගලික ආයතනයකට අයත් නොවේ

i) පෞද්ගලික බැංකු
ii) සුපිරි වෙළඳසැල්
iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

46) ''උකුසු හාමි බොහොම ඉහළ-මුව පැටියෙක් ඇල්ලුවා" කියමින් කරන ක්‍රීඩාවේ රවුම මැද සිටින සිසුවා නම් කරන්නේ

i) මුව පැටියා ලෙස
ii) උකුස්සා ලෙස
iii) එළුවා ලෙස

47) සතුන් කීප දෙනෙකුගේ නම් සඳහන් කාඩ්පත් ඇතැතිව පැමිණි සිසුන් පිරිසක් අතරින් එක් සිසුවෙක් මෙසේ පැවසුවේ ය.

''ඔයගොල්ලෝ නිතර නිතර කුණු පිච්චුවොත්, බිමට උණු වතුර දැම්මොත් මායි මගේ පැටවුනුයි මැරිලා යාවි"

මෙම සිසුවා අත තිබූ කාඩ්පතේ සඳහන් සතා විය හැක්කේ,

i) පූසා
ii) සමනලයා
iii) ගැඩවිලා

48) පෘථිවි ගෝලයේ ආකෘතිය තබා එක් පසෙකින් විදුලි පන්දමක් එල්ල කිරීමෙන් ආදර්ශනය කරන්නේ,

i) පෘථිවි ගෝලයේ විවිධ රටවලට දිවා කාලය හා රාත්‍රී කාලය ඇති වන බව
ii) චන්ද්‍රයා වටා පෘථිවිය ගමන් කරන බව
iii) සූර්යයා පෘථිවිය වටා ගමන් කරන බව

49) රටේ කීර්ති නාමය නැංවීමට දායක වූ රූපයේ දැක්වෙන මැතිතුමා වන්නේ,



i) ආචාර්ය ටී.බී. ජායා මැතිතුමා
ii) ආචාර්ය ආනන්ද කුමාරස්වාමී මැතිතුමා
iii) ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා

50) අතීතයේ සිට පැවත එන ජනප්‍රිය ක්‍රීඩාවක් වන 'ඔලිඳ කෙළිය' ක්‍රීඩාව සඳහා යොදා ගන්නා පුවරුවේ එක් පසෙක ඇති සිදුරු ගණන වන්නේ,

i) 7
ii) 10
iii) 5

51) අත කොළුව, නියන, වරක්කලය වැනි උපකරණ භාවිතයට ගන්නා කර්මාන්තය වන්නේ,

i) පෙදෙරේරු කර්මාන්තය
ii) කම්හල් කර්මාන්තය
iii) වඩු කර්මාන්තය

52) රෝග වාහක පුද්ගලයින් නිසා වැළඳිය නොහැකි රෝගයකි.

i) පැපොල ii) දියවැඩියාව iii) සෙම්ප්‍රතිශ්‍යාව

53) පැටවු තම පිට උඩ තබා ගෙන යන සත්ත්ව විශේෂ දෙකකි.

i) ඈයා, පූසා ii) ගෝනුස්සා, හැකරුල්ලා iii) ගිරවා, තලගොයා

54) නටුව තැඹිලි, මල් පෙති සුදු පැහැයෙන් යුක්ත ව, රාත්‍රියේ පිපී උදේට නටුවෙන් ගිලිහෙන මල් වර්ගය වන්නේ,

i) සමන් පිච්ච ii) සේපාලිකා iii) කුමුදු

55) ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන මාධ්‍යයකි.

i) ගුවන් විදුලිය ii) රූපවාහිනිය iii) වේදිකාව

56) ශ්‍රී ලංකාවේ වාහන සෑම විට ම ගමන් කරන්නේ,

i) දකුණු පසිනි ii) වම් පසිනි iii) මැදිනි

57) අනාරක්ෂිත ආහාර ගැනීමෙන් වැළඳෙන රෝගයකි,

i) උණ සන්නිපාතය ii) පාචනය iii) කොරෝනා වෛරසය

58) ජලයේ ඇති ගුණාංගයක් නොවේ,

i) ගලා යාමේ හැකියාව iii) නිශ්චිත හැඩයක් තිබීම

ii) උණු කළ විට වාෂ්ප වීම

59) අපට ආර්ථික වාසි ලබා ගැනීම සඳහා ඇති කරන සතුන් යුගලයකි

i) ඌරා , ගවයා ii) බල්ලා , පූසා iii) කුකුළා , අලියා

60) තාත්තා මහන්සියෙන් අස්වැද්දූ කෙත් යායේ ගොයම් කරල් රන්වන් පාටින් පැසී බිමට නැමී තිබේ. දැන් ඇත්තේ එහි අස්වනු නෙළා ගැනීමේ කාලයයි. ඒ සඳහා සියල්ලෝ ම ලහි ලහියේ සූදානම් වෙති.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන "අපේ කුඹුරේ ගොයම් කපන්නේ අද‍යි" යන මාතෘකාවට නිර්මාණාත්මක වැකි තුනක් ලියන්න. (උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු අතර එක් වාක්‍යක වචන පහකට නොඅඩු විය යුතුය.

i) .....

.....

ii) .....

.....

iii) .....

.....